# සබරගමු නාට්‍ය කලාව

ලංකා ගාන්ධර්ව සභාවේ උඩරට නැටුම් පිළිබඳ පරීක්ෂක සහ ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ උඩරට නැටුම් පිළිබඳ ගරු පරීක්ෂක

**ඊ. ඒ. දෙල්ගොඩ**

සබරගමු නැටුම ඉතාම පැරණි ජාතික සංස්කෘතියට අයත්, කුරුවිට, නවදුන්, අටකලන්, කඩවත, මැද, කුකුළු, කොළොන්න යන කෝරළ වලින් යුත් සබරගමුවට සීමාවූ ප්‍රිය උපදවන නාට්‍ය කලාවකි. විජයාවතරණයට පෙර මෙහි සිටි යක්ෂ, නාග ගෝත්‍රික මනුෂ්‍යයන් අතරින් යක්ෂ ගෝත්‍රිකයෝ විවිධ යක්ෂ ස්තෝත්‍රවලින් පිහිට ලබාගත් බව පාරම්පරික කථා වලින් පැහැදිලි වේ. ඒ නිසා ඊට සම්බන්ධවූ නැටුම්ද තිබිය යුතුය, ඒ කුමක් වුවත් යක්ෂ ස්තෝත්‍රයන්ද සම්බන්ධකොට පවතින සබරගමු නාට්‍ය කලාව ඉපැරණි එකක් බව කිව හැකිය. සබරගමු-නැට්ටුවාගේ ඇඳුම් ගැන සලකා බලන විටද වෙනත් රටක ඇඳුම් හා සම්මිශ්‍ර නොවූ මෙරටටම අයත්වූ ඇඳුම් බව පිළිගත හැකිය.

සබරගමු නාට්‍ය කලාවට අයත් අංග සියල්ලක් පහත දැක්වෙන කවිපෙළින් දැක්වේ.

සිවු සැට සවිදමකින්ද — බෙදුනු දෙනිස රාගම්ද
තාලම් තිස් අටකින්ද — වන්නම් දහ අටකී

දෙතිසක් කවුත්තමින් ද — එලෙස සරඹ දෙළසින්ද
වට්ටම් සිවු ගණනින්ද — මතයෙන් නම් පසකී

පසලොස වද මාදම්ද — අඩවි එසත අබිනෙන්ද
අවදනම් පයකින්ද — කලා සන්ද පහකී

තිරු මාරු සමගින්ද — මිහිරි තාල පසකින්ද
යැදි මෙනැවුම් මන නන්ද — සබරගමුවෙ දෙයකී

වටපද සමයන් කුමර දෙවොල් පද ආවැන්දුම මාත්‍රාද ගෙනා
වල්පද පන්දම් හීන්තාලමත් කාහුල් පද සහ අඩව් තනා
කෝල් පාඩුවද මුදුන්තාල සහ මුගුරු දෝලි හත් පදය ගෙනා
රකුසු හලම් පද අයිල්ද දුම්මල යහන් දැකුම මෙහි පැවත එනා

පිරුවට පැහිදුම බුලත්ද පොත්කඩ වාමර පොල් ඇ සමග යසේ
කෙන්ඩි කලස් පාලියද හඳුන් කිරි පැන් ගොටුවේ පාලියද මෙසේ
අහුරුද දුම්මල පලිහෙ පාලියද මාළුගෙඩියෙ පාලියද රසේ
පැවතෙයි මෙලෙසින් නැටුම් මෙ පිළිවෙල රහ දෙන නළුවෝ පෙර දවසේ

මේ කවි පෙළින් විස්තර වන්නේ සබරගමු නැටුම් පිළිබඳ විස්තරයකි. මෙයින් පිට සබරගමු නාට්‍ය කලාවට අයත් දෙයක් ඇති නොවේ. වාදනයද මෙම නාට්‍ය කලාවට අයත්

වැදගත් දෙයකි. වාදනය මෙන්ම නැටුම ගැනද එමෙන්ම ගායනය ගැනද නාට්‍ය කර දැනගෙන තිබිය යුතුය. ගායනය, වාදනය, නර්තනය යන තුනම හොඳින් නොදන්නා අංග සම්පූර්ණ නැට්ටුවෙක් නොවේ.

මේ නාට්‍ය කලාව ගොඩ නැඟී ඇත්තේ මාත්‍රා පහක නැටුම් පදනම් කරගෙනය.

1. සින්දු මාත්‍රය
2. උඩරට මාත්‍රය
3. ගමන් මාත්‍රය
4. යක්පද මාත්‍රය
5. නාඩගම් මාත්‍රය යනු ඒ පහයි.

මේ මාත්‍රා පහට අයත් කස්තිරම් තීරු මානම්, හා අඩව් තිබේ. මාත්‍රයකට තීරුමානම, කස්තිරම, අඩව් ගණනක් බැගින් මාත්‍රා පහට කස්තිරම්, තීරුමානම් හා අඩව් එකසිය පනස් හතක් (157) වේ.

මෙම සබරගමු නැටුම් පැවැත්වෙන අවස්ථා හතරක් ප්‍රධාන වශයෙන් වෙන් කළ හැකියි.

1. විහාරස්ථානවල දේවස්ථානවල කරන ආගමික උත්සව සම්බන්ධ නැටුම්.
2. දෙවියන්ගෙන් හා නවග්‍රහයින්ගෙන් ශාන්තියක් ලබාගැනීමට කරන තෝත්‍ර.
3. යක්ෂයින්ගෙන් වන උවදුරු දුරුකර ගැනීමට කරන තෝත්‍ර.
4. සාමාන්‍ය මංගල උත්සව සඳහා පැවත්වෙන විනෝදය සඳහා කරන නැටුම් ද වේ.

මෙයින් පළමුවන වර්ගයේ නැටුම් ධාතු පෙරහැර වලදී, මහා සංඝයා වැඩම වීමේදී වැනි ආගමික උත්සව වලදී පැවැත්වේ. මාත්‍රා පහටම අයත් නැටුම් මේ ස්ථානවලදී දක්වනු ලැබේ. ඇසල පෙරහැරේ දේවාභරණ වැඩමවීම දිග්ගෙයි නැටුම වැනි දේවස්ථාන වලදී පැවැත්වෙන ආගමික උත්සව පිළිබඳ නැටුම්ද පළමුවන වර්ගයට අයත්ය.

දිග්ගෙයි නැටුම සබරගමුවේ දේවාලයන්ට පමණක් සීමාවූ ස්ත්‍රීන් විසින් පමණක් පවත්වනු ලබන ක්‍රීඩා විශෙෂයකි. මෙහි බෙර වාදනය පමණක් පිරිමින්ට හිමිවේ. මේ සඳහා සිංහළ රජ දරුවන් විසින් ගම් බිම් රාශියක් ප්‍රදානය කර ඇත. මෙයට සහභාගිවන ස්ත්‍රීන් නම් වශයෙන්

| | |
|---|---|
| සබරගමුවෙ මානික්‍ය | මහගෙ |
| එගොඩ කුට්ටමේ මාණික්‍ය | මහගෙ |
| හුණුවල මාණික්‍ය | මහගෙ |
| හිරිකන්දෙනියෙ මාණික්‍ය | මහගෙ |

යනුවෙන් හැඳින්වේ. එයින් පැවත එන්නෝ මේ නැටුමට හිමි කාරයෝ වෙත්. මේ දිග්ගෙයි නැටුම අද පහත් තත්වයකට වැටී ඇත්තේ බොහෝ දෙනාගේ නොසැලකිල්ල නිසාය.

දෙවන වර්ගයේ දෙවියන්ගෙන් පිහිට ලබාගැනීමට කරන තෝත්‍රද මෙයට අයත්ය. එසේ පවත්වන තෝත්‍රද ගණනාවකි.

1. පාන්මඩුව
2. පූනා මඩුව
3. දෙවොල් මඩුව
4. ගම්මඩු
5. ගී මඩු
6. හැල්ලුම් මඩුව
7. කිරි මඩුව යන මේවා වේ.

**පාන්මඩුව**:— මෙයින් බලාපොරොත්තු වන්නේ ගම් ප්‍රදේශවල ඇතිවන වසූරිය, පැපොල, සරම්ප, අතිසාරය ආදී බෝවන රෝග පැතිරීයාම වැලැක්වීමයි. මෙම රෝග දේව කෝප නිසා ඇතිවන බව ගැමි ජනතාවගේ පිළිගැනීමයි. ඒ නිසා එම දේව කෝප සංසිඳවා දෙවියන් ගෙන් ශාන්තියක් ලබා ගැනීමේ අදහසින් මෙම පාන්මඩු පවත්වනු ලැබේ. මේ පිහිට යදින්නේ පත්තිනි දෙවියන්ට, වඳුරුමාල දෙවියන්ට, කතරගම දෙවියන්ට, දෙවොල් සත් කට්ටුවට, කුරුම්බර යක්ෂයින්ට හා අනිකුත් දෙවි වරුන්ටය. මේ තෝත්‍රය ඉතාම පැරණි එකකි. මෙයට සබරගමු නැටුම් මාත්‍රා කිපයක්ම යොදනු ලැබේ.

**පූනා මඩුව**:— මේ සඳහාද පාන් මඩුවට අයත් නැටුම්ද සෙත් කවිද පැවැත්වේ. ඊට වඩා විශෙෂ වනුයේ පූනාවයි. පූනාව නම් දර හතරක්, කෙම් දෙළසක්, නයි පෙණ පහක් පිටතටත්, දිවිහිස් තුනක් ඇතුළටත් සිටිනසේ මැටියෙන් සාද අව්වේ වියලා ගන්නා එකකි. මෙය පාන් මඩුව නටන්ට දින තුනකට පමණ කලින් සාදගනු ලැබේ. පූනා මඩුව අවසානයේදී ඒ පූනාව ඔයක්, ගඟක්, වැවක්, වැනි ජලාශයකට ගෙන ගොස් දිය යටදී බිඳ කපුරාල දියෙන් ගොඩ ආ විගස රතු රෙද්දකින් හිස වසාගෙන ගොස් ගොනෙකුගේ ඇඟට අත තබනු ලැබේ. ඊටපසු සෙත්කවි කීමෙන් තෝත්‍රය අවසන් වේ. මේ සියල්ලෙහිදී සබරගමු නැටුම්වලට අයත් සියලු නැටුම් යෙදේ.

**දෙවොල් මඩුව**:— මෙය ගම් ප්‍රදේශ වලට පමණක් නොව තනි පුද්ගලයන්ට සෙත් පැතීම සඳහාද පවත්වනු ලැබේ. මෙහිදී දෙවොල් සත් කට්ටුවෙන් ශාන්තියක් බලාපොරොත්තු වේ. මෙයටද සබරගමු නැටුම් ඇතුළත් වේ.

**ගම්මඩු**:— මේවා ගම් ප්‍රදේශවලට ශාන්තියක් ලබාගැනීම සඳහා පවත්වනු ලැබේ. මෙයින් ප්‍රකාශ වන්නේ දෙවොල් දෙවියන් ලක්දිවට ගොඩබට විලාශයය. මෙහි අනෙක් මඩුවලට වඩා විශෙෂයක් ඇත්තේ ගිණි පැගීම නොමැති කමය.

**ගී මඩු**:— මෙය තනි පුද්ගලයින්ට පැමිණෙන උවදුරු වලක්වා සෙත් පැතීමේ සුළු ක්‍රමයකි. පත්තිනි, කතරගම දෙවි වරුන්ගෙන් පිහිට පතා කපුරාල ලවා සෙත් ගී කියවා පසුද උදේ දෙවියන්ට දෙන දානයෙන් මෙය අවසන්වේ.

**හැල්ලුම් මඩුව**:— මෙය සාමාන්‍ය උවදුරු වලට හා ගව පට්ටිවලට පැමිණෙන උවදුරුවලට ශාන්තියක් ලබාගැනීම සඳහා පැවැත්වෙන දේව තෝත්‍ර වර්ගයකි. රාත්‍රි තිස්පැයක යාගයක් මීට ඇතුලත්ය. මෙයින් ශාන්තියක් ලැබෙන බවද රටේ ප්‍රකට කරුණකි. මීටද සබරගමු නැටුම් අවශ්‍ය වේ.

**කිරි මඩුව**:— මෙයින් ශාන්තියක් බලාපොරොත්තු වන්නේ ගර්භනීන් හා ගවපට්ටි හිමියන්ය. මෙයද දේව තෝත්‍රයකි. මෙහිදී කිරි ඉතිරවීම ප්‍රධාන වන බැවින් එයට ඒ නම යෙදී තිබේ. මෙයින් සෙත් යදින්නේ පත්තිනි දේවී මංගර දේවි හා නවසිය සිල්වාරමක් පමණ මංගර සේනාව ගෙන්ය. මෙයටද සබරගමු නැටුම් අවශ්‍ය වේ.

දෙවන අංකයට ගැනෙන දේව තෝත්‍ර මෙන්ම නව ග්‍රහයින්ගේ පිහිට බලාපොරොත්තුවෙන් කරන තෝත්‍රද ඇත. දෙවිදෝෂ, යක්ෂ දෝෂ හින් දෝෂ යන දෝෂයන් දුරු කිරීමට කරන බලි යාගයන්ද සබරගමු නාට්‍ය කලාවට අයත්ව පැවැත්වේ. සබරගමු පළාතේ විශාල වශයෙන් කෙරෙන මෙම බලි යාගයන්ගෙන් බලාපොරොත්තු වන්නේ අට අනූවක් රෝග, නව අනූවක් ව්‍යාධි, දෙසිය තුනක් අතුරු ආන්ත්‍රා, හින්දෝෂ, දෙවිදෝෂ, යක්ෂදෝෂ යනාදී කෝටියක් දෝෂ දුරුකර ගැනීමයි. මෙය සබරගමු ප්‍රදේශයේ බහුලව පවතින්නකි. මෙයට සින්දු මාත්‍රය, උඩරට මාත්‍රය, යක්පද මාත්‍රය යන්ද ඊට අයිති කස්තිරම්, තීරුමානම් හා අඩව්ද අවශ්‍යමය.

යක්ෂයින්ගෙන් වන උපද්‍රව දුරුකර ගැනීමට කරන තෝත්‍ර තුන්වන සංඛ්‍යාවට ගැනේ. සබරගමු නැටුම් මෙයටද අවශ්‍යයි. මේ වායේදී වැඩි වශයෙන් යක්පද මාත්‍රයට හා නාඩගම් මාත්‍රයට අයත් නැටුම් යොදනු ලැබේ. එහෙත් සමහර අවස්ථාවලදී සින්දු මාත්‍රයට අයත් මාත්‍ර කස්තිරම් තීරුමානම් හා අඩව්ද උවමනා කෙරේ. යක්ෂ උපද්‍රව දුරුකිරීම සඳහා සන්නි යකුම්, කොහොඹ යකුම්, කුමාර යකුම්, ගරායකුම්, රට යකුම්, මහසොහොන් සමයම්, දෙවොල් සමයම්, කුමාර සමයම්, ඉරමුදුම් සමයම්, හූනියම් මඩු, දෙහි මඩු, දෑරුහැව, පිදවිනි සාන්තුව යනාදී යක් තොවිල් කරනු ලැබේ.

සන්නියකුම් තෝත්‍රයේදී සබරගමු නැටුමට අයත පන්දම් පද, මල්පද සහ වෙනත් පද පාලි අනුගමනය කරනු ලැබේ. මීට අයත් සියලුම කවි යන්පද හා නාඩගම් මාත්‍රයට අයත්ය. මෙහි අවසානයට වෙස් මුහුණු බැඳගෙන දහඅට සන්නිය කියනු ලැබේ. ඊටද විශේෂයෙන්ම සබරගමු නැටුම් අවශ්‍යය. ඒ හැර වෙනත් යක්ෂ තෝත්‍ර ආදියටත් යමයම් ආදියටත් ඉතිරි හූනියම් මඩු, ගැති මඩු යනාදී සුළු යක්ෂ තෝත්‍ර වලටත් සබරගමු නැටුමට අයත් මාත්‍රා පමණම නැටුම් යොදනු ලැබේ.

හතරවැනි අංකයේ ලා සැලකෙන මංගල්‍ය උත්සව වැනි අවස්ථාවන්හිදී විනෝදය සඳහා පැවැත්වෙන සබරගමු නැටුම්ද වේ. මෙවායේදී මාත්‍රා පහටම අයත් නැටුම්ද ඊට අයත් කස්තිරම්, තීරුමානම්, අඩව් සහ වන්නම්වලට අයත් කවිද භාවිතවේ. මෙහිදී සින්දු මාත්‍රයට අයත් නැටුම් විශේෂ වේ. මෙම අවස්ථාවේදී ඔහු

සිරසට ලසද්සඳා පටාව — පොටත් ගෙල සද්සඳා
දෙකනට ලසද්සඳා කුණ්ඩල — දැගෙන හැරෙ සද්සඳා
දෙඅතට ලසද්සඳා බන්දිය — යරඹ දර සද්සඳා
ඉහවට ලසද්සඳා සුදු සලු — රතුපටල සද්සඳා

මුකයට ලසද්සඳා කව් ගී — සින්දු කිය සද්සඳා
කිකිණි බදිසද්සඳා මල්දෙක — දෙ අතට ග සද්සඳා
දෙපයට ලසද්සඳා සිලම්බු — නද හඬ ව සද්සඳා
සබයට එසද්සඳා හැඩකර — නැටුම් නට සද්සඳා

ඇත සිටිසද්සඳා පිළිවෙල — යොද බල සද්සඳා
මැනට එසද්සඳා පෙළ පෙළ — සිට සැර සෙ සද්සඳා
ගීත කරසද්සඳා පද සුර — ලින් නද දෙ සද්සඳා
දෝත නගසද්සඳා මැතිළතු — මන් දක ග සද්සඳා

යනාමේ ඔහුගේ නියම් ආයින්තමින් සැරසී නැටුම් දක්වයි. මේ අවස්ථාවේදී ඔහුට බොහෝ විශේෂ තෑගිද පිරිනමනු ලැබේ.

සබරගමු නාට්‍ය කලාවට අයත් වටිනාදේ දක්ෂ කලා කරුවන්ගේ ගෝලයන්ට පවා නුදුන් බැවින් ඒවා ඒ හිමියන් සමගම අභාවයට පත්විය. සිංහල ජාතියේ ශ්‍රෙෂ්ඨතම දෙයක්වූ ජාතික නාට්‍ය කලාව ගුරු ගෝල පරම්පරාවෙන් අතිනත ලියාගනිමින් කටපාඩමෙන් පවත්වා ගනිමින් පැවතුනු බව පෙනේ. කාලයාගේ ඇවෑමෙන්ද සමාජ චාරිත්‍රයන්ගේ පරිවර්තනයෙන්ද සිංහල ජාතික සංස්කෘතියට අයත් බොහෝදේ පිරිහීමට පත්විය. එසේ පිරිහුනු දෙයින් සමහරක් ස්වල්ප වශයෙන් සමහර අය අතර උසස් අන්දමින් පැවතෙනු දකිම සතුටකි. පුරාණයේ සිටි සබරගමු කලාකරුවෝ භාෂාව ගැන නොදන සිටි බැවින් ඔවුන් මෙය දන සිටියේ කට පාඩමින් අනුගමනය කිරීමෙනුත්ය. ඒනිසා මෙය ග්‍රන්ථාරූඪවූයේ භාෂාව ලියන්ට දනසිටි කීප දෙනෙකුගෙන් පමණකි. ඔවුන්ද සියලු දේ පොත්වලට ඇතුල් නොකිරීම නිසා මෑත භාගයේ කලා කරුවෝ ඒවායේ අඩුපාඩු දනගෙන එසේ අඩුපාඩු තිබියදී මෙය ක්‍රමානුකූලව ගෙනයා නොහැකි බැවින් අතහැර දමුහ. ඒ අතරට සමාජ විපර්‍යාසය නිසා ගුවන් විදුලි චිත්‍රපට, ක්ලබ්, කානිවල් ආදියෙන් විනෝද වීමට අවස්ථාව ලැබී ඒ අනුව හැඩගැසුනු නිසා මෙය අඳුරෙන් අඳුරටම පත්විය. සබරගමු නාට්‍ය කලාව විස්තරවන පොත්පත් දනට සිටින සබරගමු නාට්‍යකරුවාට නොලැබීම නිසා ද එක් එක් ගුරුවරයා තමා දන්නා පමණ ගෝලයාට කියා දීම නිසා දනට සිටින කලා කරුවා තමා දන්නා ටිකෙන්ම පිරිමසන නිසාද මෙය පිරිහීමට යයි.

මෙසේ කලක් ගතවූ අතර මා පළාත් පාලන හා සංස්කෘතික ඇමති තුමාවෙත 1957 දී කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු එතුමා සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂකතුමාද මෙහි ඇති වටිනාකම පිළිගෙන මෙම නාට්‍ය කලාව පිළිබඳ කරුණු සොයා ඉදිරිපත් කරන ලෙස